# "මා මනුෂ්‍යයෙකු නො වෙනවා වැනිය"

## සෞදි අරාබියේ ආසියානු ගෘහ සේවක අපයෝජනයන්.


**I. සාරාංශය** ....................................................................................................

නෛතික රාමුව සහ බඳවා ගැනීමේ භාවිතයන් ......................................................

ගෘහ සේවක අපයෝජනයන් ..................................................................................

නිවැරදි කිරීමේ දරිද්‍ර යාන්ත්‍රණයන් ..............................................................................

සෞදි අරාබියේ ආණ්ඩුව වෙත වන ප්‍රධාන නිර්දේශ ..................................................

සංක්‍රමණයන්ගේ රටවල ආණ්ඩු වෙත වන ප්‍රධාන නිර්දේශ ........................................

(ඉන්දියාව, ශ්‍රී ලංකාව, පිලිපීනය හා නේපාලය ඇතුළුව) .........................................

**II. ක්‍රමවේදය** ....................................................................................................

**III. සෞදි අරාබිය වෙත වන ආසියානු ස්ත්‍රී ශ්‍රම සංක්‍රමණය** ................................................

සංක්‍රමණය සඳහා වන ආසියානු ස්ත්‍රීන්ගේ තත්ත්වය හා හේතු ................................

සෞදි අරාබියේ ස්ත්‍රීන්ගේ තත්ත්වය ..............................................................................

අකටයුතුකම්වල පරිමාණය ..........................................................................................

**IV. සංක්‍රමණික ගෘහ සේවකයන් සඳහා වන නෛතික රාමුව** ..............................................

කම්කරු නීතිවලින් බැහැර කිරීම ..................................................................................

කපාලා (kafala) ක්‍රමය ...........................................................................................

සේවා නියුක්ති ගිවිසුම් හා බඳවා ගැනීමේ භාවිතයන් ..............................................

ජාත්‍යන්තර ගිවිසුම් ....................................................................................................

මෑත කාලීන ප්‍රතිසංස්කරණ ..........................................................................................

**V. බලහත්කාර ශ්‍රමය, නීති විරෝධී ශ්‍රමික වෙළෙඳාම, වහල්භාවය සහ** ...............................

වහල්භාවය වැනි තත්ත්වයන් .......................................................................................

බලහත්කාර ශ්‍රමය ........................................................................................................

නීති විරෝධී ශ්‍රමික වෙළෙඳාම ......................................................................................

වහල්භාවය හා වහල්භාවය වැනි තත්ත්වයන් ...........................................................

VI. **බඳවා ගැනීම් හා සංක්‍රමණය හා සම්බන්ධ අපයෝජනයන් හා බලහත්කාර රඳවා ගැනීම්**
ශ්‍රමික සැපයුම් රටවල බඳවා ගැනීමේ නියෝජිතයන් විසින් කරනු ලබන අපයෝජනයන්..........................................................................................................
සෞදි අරාබියේ බඳවා ගැනීමේ නියෝජිතයන් විසින් කරනු ලබන අපයෝජනයන් .......
සේව්‍යයන් විසින් කරනු ලබන රඳවා තබා ගැනීම් ....................................................

VII. **මනෝවිද්‍යාත්මක, කායික හා ලිංගික අපයෝජනය .......................................................**
මනෝවිද්‍යාත්මක හා වාචික අපයෝජනය ................................................................
කායික අපයෝජනය ................................................................................................
ආහාර අහිමි කිරීම ..................................................................................................
ලිංගික හිංසනය හා අපයෝජනය .........................................................................

VIII. **ශ්‍රම අපයෝජනයන් හා සූරාකෑම ..........................................................................**
පහළ හා අසමාන වැටුප් ........................................................................................
නොගෙවූ වැටුප් හා වැටුප්වලින් අඩු කිරීම් ............................................................
අධික වැඩබර, දීර්ඝ වැඩ පැය, විවේක කාලවල අඩුව ..........................................
ප්‍රමාණවත් නොවන ජීවත්වීමේ පහසුකම් ..................................................................

IX. **ගෘහ සේවකයන්ට එරෙහි අපරාධ නඩු .......................................................................**
පටිපාටිමය උල්ලංඝනයන් .......................................................................................
සොරකම් කිරීම පිළිබඳ ප්‍රතිචෝදනා, මායාකර්ම හෝ බොරු චෝදනා ......................
සදාචාරමය අපරාධ ..................................................................................................

X. **සෞදි ආරක්ෂක පියවර සහ හිඩැස් ..........................................................................**
ගෘහ සේවකයන් සඳහා වන සමාජ සේවා කටයුතු අමාත්‍යාංශ කේන්ද්‍රය ...................
පිටුවහල් කිරීම .........................................................................................................
සංක්‍රමණිකයන් ගේ ඉතිරිවන්නන් සිය රට යැවීම ..................................................

XI. **ශ්‍රම සැපයුම් රටවල ආරක්ෂණ පියවර සහ හිඩැස් .......................................................**
සෞදි අරාබියේ වැඩ කිරීමට ඇති සීමා බන්ධන .....................................................
සම්පත් ඌනතාව හා අසමාන ප්‍රතිචාර ...................................................................
විශේෂ දූත මණ්ඩල විසින් ශ්‍රම ආරාවුල් විසඳීම. ....................................................

**XII. සවිස්තර නිර්දේශ** ..........................................................................................................
සෞදි අරාබියේ ආණ්ඩුව වෙත ..........................................................................................
ශ්‍රමිකයන්ගේ රටවල ආණ්ඩු වෙත (ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව, පිලිපීනය හා නේපාලය ඇතුළුව) ..........................................................................................................
සියලුම ආණ්ඩු වෙත. ...............................................................................................
ලෝක කම්කරු සංවිධානය හා සංක්‍රමණිකයන් සඳහා වන ජාත්‍යන්තර සංවිධානය වෙත. ..........................................................................................................
ලෝක බැංකුව හා පෞද්ගලික පදනම් වැනි ප්‍රදානකයන් වෙත .................................
පිළි ගැනීම් ..........................................................................................................

# I. සාරාංශය

*ආරම්භක වශයෙන් මම මගේ මාසික වැටුප ලෙස රියාල් 400 ක් ලබා ගත්තා. සෑම දෙවසරකට වරක් ඔවුන් එය රියාල් 100 කින් හෝ 200 කින් වැඩි කළා. අවසාන වන විට මම මාසයකයට රියාල් 700 ක් (ඩොලර් 182 ක්) අපයා ගත්තා. මගේ ඉහළම වැටුපේ දී මම අන්තිම වරට ඔවුන් හැර ගිය විට මට අතිරේඛ මුදලක් දුන්නා. මම මුදල් ඉතිරි කරන්න පුරුදු වෙලා හිටියා. මම රියාල් 200 ක්, 500 ක් නැත්නම් 700 ක් මගේ ගෙදරට යැව්වා. ....... මගේ සැමියා ඉතා පරිස්සමින් මුදල් පරිහරණය කළා. ඔහු ඒ මුදල් මේ ගේ සෑදිමට, මගේ ළමයින්ට ඉගැන්වීමට හා පෝෂණය කිරීමට, ඔවුන්ගේ වෛද්‍ය වියදම් සඳහා වියදම් ගෙවීමට වැය කළා.*

—එෆ්. පාතිමා, ආපසු පැමිණි ගෘහ සේවිකාවක්, ගම්පහ, ශ්‍රී ලංකාව 2006 නොවැම්බර් 08.

*මගේ මුළු කතාවම  කියනවා නම් එය දවසකින් හෝ රාත්‍රියකින්වත් කියලා ඉවර කරන්න බැරි වේවි. මම ආපසු ගෙදර එන විට මම කිසි දෙයක් නොගෙන්න පුළුවන්.............. මධ්‍ය රාත්‍රියේ 12 සිට පාන්දර 2.30 දක්වා මගේ සේව්‍යා මට විදුලි කම්බියකින් පහර දුන්නා. අන්තිමට අනෙක් මැඩම්ලා (සේව්‍යයන්) උඹව ගෙදර යවනන්න පුළුවන්. නමුත් මං උබව යවන්නේ නෑ. උඹට තෝරගන්න දෙකක් තියෙනවා. එක්කෝ උඹ පඩියක් නැතිව වැඩ කරන්න ඕන නැත්නම් උඹ මෙතන මැරෙන්ඩ ඕන. උඹ මැරුනොත් උඹ සියදිවි හානි කර ගත්තා කියලා මං පොලිසියට කියනවා කියලා ඇය කිව්වා.*

*මම පඩියක් නැතිව වැඩ කළා වුවත් මට පහර නොදේවී යැයි සහතිකයක් මට තිඉබුනේ නැහැ. ඒ නිසායි මම පැනලා ආවේ. සියලුම දොරවල් වහලා තිබුණේ. ඒ නිසා පිට වෙන්න මගක් තිබුණේ නැහැ. ජනේල වල යකඩ පොලු හයි කරලා තිබුනා. නමුත් නාන කාමරයේ වාත්‍රාශ්‍රය සඳහා සිදුරක් තිබුණා. මම එයින් පැනලා ආවා. පැනගන්න ඉස්සරවෙලා මම යාඥා කරලා අල්ලාගෙන් ඉල්ලා සිටියා ඇය මට මාසයක් නාන්න දුන්නේ නැති නිසා මගේ ශරීරය ඉතා අපිරිසිදු වුවත් මට උදව් කරන්න කියලා. මම යාඥා කළා.*

—ඉන්දුනීසියානු ගෘහ සේවිකාවක් වන එස්.මීනා - රියාද් සෞදි අරාබිය 2008 මාර්තු 12.

සංක්‍රමණය වීම අවාස්ථාව හා අවදානම් යන දෙකම ලබා දෙයි. ඇතැම් විට අන්කිසි තැනකට වඩා මෙය ආසියාව හා මැද පෙරදිග අතර වන දැවැන්ත කොන්ත්‍රාත් ශ්‍රම පාලනයේ දී පැහැදිලිව පෙනේ. සාධනීය පැත්තෙන් ගත් කල ශ්‍රමිකයෝ ඩොලර් බිලියන ගණනින් ගෙවල්වලට මුදල් යවති. හොඳම උදාහරණ ලෙස ගතහොත් මේ මුදල් ඔවුන්ගේ පවුල් දුප්පත්කමෙන් මුදවා ගනිති. ගෙවල් ඉදි කිරීම සඳහා වැය කරති. අධ්‍යාපනයට වැය කරති. සෞඛ්‍යාරක්ෂණය සඳහා වැය කරති. ඒ අතර, තමන්ගේ සත්කාරක රටේ ආර්ථිකයට දායක වෙති. නරකම උදාහරණවලදි ශ්‍රමිකයෝ ඔවුන්ගේ ජීවිත ඔවුන්ට අහිමි වෙති. නැතහොත් බලහත්කාර ශ්‍රමයට පාත්‍ර වීම හා නීති විරෝධි ශ්‍රමික වෙළෙඳාමට භාජනය වෙති. බොහෝ සංක්‍රමණිකයන්ගේ අත්දැකීම් මේ අතරතුර කුමන හෝ තැනකට ඇතුළත් වේ.

ආසන්න වශයෙන් ප්‍රධාන කොටම ඉන්දුනීසියාවෙන්, ශ්‍රී ලංකාවෙන් හා පිලිපීනයෙන් පැමිණි ගෘහ සේවිකාවෝ ද.ල. 1.5 ක් පමණ සෞදි අරාබියේ වැඩ කරති. මෙම ස්ත්‍රී කම්කරුවන් ඔවුන් උපයන විදේශ විනිමය නිසා තම රටවල අද දවසේ වීරවරියන් ලෙස දැක්ක ද අනෙක් වර්ගවල කම්කරුවන්ට වඩා සෞදි අරාබියේ ඔවුන් ලබනුයේ අඩු ආරක්ෂාවකි. ඔවුහු පිළියමක් පිළිබඳ බලාපොරොත්තු ස්වල්පයක් ඇති, නැතහොත් කොහෙත්ම අදහාගත නොහැකි තරමේ වධහිංසනයන්නට අනාවරණව වෙසෙති. ගෘහ සේවකයන් සෞදි අරාබියේ වැඩ කරන ද.ල. 8ක් පමණ වන විදේශිකයන්ගෙන් හතරෙන් එකකට වඩා අඩු වුවද තමන්ට ලැබෙන පැමිණිලිවලින් අති විශාල බහුතරයක් ගෘහ සේවකයන්ට එරෙහිව කෙරෙන අකටයුතුකම් හා වධ හිංසා සම්බන්ධයෙන් බව ශ්‍රමික නිර්යාත රටවල තානාපති කාර්යාල වාර්තා කරයි.

බොහෝ ගෘහ සේවක - සේවිකාවන් යහපත් වැඩ කිරීමේ තත්ත්වයන් භුක්ති විඳින අතර, අනෙකුත් අය වැටුප් නොගෙවීම, බලහත්කාර රඳවා ගැනීම, ආහාර නොදීම, අධිකතර වැඩබර හා බරපතල මනෝවිද්‍යාත්මක, කායික හා ලිංගික හිරිහැරවලට මුහුණපෑම් ඇතුළු අකටයුතුකම් හා වධ හිංසා පරාසයක් විඳ දරා ගෙන සිටිති. බලහත්කාර ශ්‍රමය, නීතිවිරෝධි ශ්‍රමික වෙළෙඳාම හෝ වහල්භාවය වැනි තත්ත්වයන් එකතුවක් වන මෙම තත්ත්වය හා සම්බන්ධ සිදුවීම් දුසිම් ගණනක් හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් ලේඛනගත කර ඇත.

හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් සම්මුඛ සාකච්ඡා කරනු ලැබූ සෞදි කම්කරු හා සමාජ කටයුතු පිළිබඳ නිලධාරී ගෘහ සේවිකාවන්ට කෙරෙන අකටයුතුකම් හා වධහිංසා පිළිබඳ ප්‍රශ්නය පිළිගත් නමුත් රටේ ගෘහ සේවක සේවිකාවන්ගේ බහුතරයට හොඳින් සලකන බව අවධාරණය කළහ. කම්කරු අයිතීන් හා අනෙකුත් මානව අයිතීන් උල්ලංඝනය කිරීම්වලට මුහුණ දෙන ස්ත්‍රී සංක්‍රමණික කම්කරුවන්ගේ සංඛ්‍යාව නිවැරදි ලෙස ගණනය කිරීමට දත්ත ඇත්තේ නැත. කෙසේ වුවද කම්කරු නීති සංග්‍රහයේ තිබෙන හිඩැස් හා සීමාකාරී සංක්‍රමණික භාවිතයන් ගෘහ සේවක සේවිකාවන්ගේ අකටයුතුකම් හා වධහිංසා පිළිබඳ අවදානම ඉහළ දමා ඇත. සෞදියේ තදබල ලිංගිකව වෙන්කර තැබීමේ හා ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් කිරීමේ සමස්ත භාවිතයන් ද ගෘහ සේවක සේවිකාවන් හුදකලා කිරීමට දායකත්වයක් ලබා දී ඇත. අකටයුතුකම් හා වධ හිංසා අත් විඳ ඇති අයට සම්පූර්ණ පිළියම් පිළිබඳ තිබෙනුයේ සුළු බලාපොරොත්තුවකි.

## නෛතික රාමුව හා බඳවා ගැනීමේ භාවිතයන්.

2005 සැප්තැම්බර් 27 දින අංක M/51 දරණ රාජකීය ආඥාව මගින් සංශෝධනය කරන ලද සෞදි කම්කරු නීතිය සතියකට වරක් දිනක නිවාඩුවක්, වැඩ කරන පැය ගණනේ සීමාවන් වැනි අනෙකුත් කම්කරුවන්ට සහතික කරනලද අයිතීන්වලින් ගෘහ සේවක සේවිකාවන් බැහැර කරන අතර අනෙකුත් කම්කරුවන්ට ඇති ආරක්ෂාවද ගෘහ සේවක සේවිකාවන්ට අහිමිකර ඇත. 2007 ඔක්තෝබරයෙහි ප්‍රකාශයට පත් කළ උසාවි ක්‍රමයේ ප්‍රතිසංස්කරණයන්ට අනුව නව කම්කරු උසාවි පිහිටුවිය යුතුය. ආණ්ඩුව යළි යළිත් ගෘහ සේවක සේවිකාවන් ආවරණය වන පිරිදි කම්කරු නීතියට සංශෝධන ගෙන එනු ඇතැයි ප්‍රකාශ කල ද 2008 ජුනි වන විටත් ඇමුණුම එතෙකුත් සම්පූර්ණ කර නොතිබිණ.

එවැනි ඇමුණුමක් සම්මත කර ක්‍රියාවට නැඟීම ඉදිරියට තිබෙන වැදගත් පියවරක් විය හැකි යයි හියුමන් රයිට්ස් වොච් විශ්වාස කරයි. කෙසේ වුවද ප්‍රතිසංස්කරණ සැබැවින් ම ප්‍රතිඵලදායි වීම පිණිස සෞදි අධිකාරීන් අනෙකුත් සේවකයින්ට සපයන සමාන ආරක්ෂණයන් ගෘහ සේවකයන්ට ද හඳුන්වාදීම හා ඔවුන් බලසතු කිරීම සඳහා වන ප්‍රමාණවත් යාන්ත්‍රණයක් සැලසීම අවශ්‍ය වේ. එසේ නොවන්නේ නම්, ඇමුණුම ගෘහ සේවක සේවිකාවන්ට එරෙහි නෛතික වෙනස්කම් කිරීම්වලට ආමන්ත්‍රණය කිරීමට අසමත් අලංකාරික වෙනසක් පමණක් වනු ඇත.

සංක්‍රමණික සේවා නියුක්ති විසා ඔවුන්ගේ සේව්‍යයන්ව බැඳ දමන සෞදි අරාබියේ සීමාවන්ට යට කරන කෆාලා (අනුග්‍රහකත්ව) ක්‍රමය සූරා කෑමට සහ අකටයුතුකම් හා හිරිහැර කිරීම්වලට ද ඉන්ධන සපයයි. මෙම ක්‍රමය යටතේ සේව්‍යයෙකු කුලියට ගනු ලබන සංක්‍රමණික සේවකයකුගේ වගකීම භාර ගන්නා අතර, සේවකයාට හෝ සේවිකාවට සෞදි අරාබියට ඇතුළු වීමට හැකි වීමට පෙර, රැකියාව මාරු කිරීමට පෙර හෝ ඊට හැර යාමට පෙර පැහැදිලි අවසරය දිය යුතු වේ. කපාලා ක්‍රමය සේව්‍යයාට සේව්‍යකු හෝ සේව්‍යක යෝධ පාලනයක් හිමි කර දෙයි. රට හැර යාමට ඔවුන්ගේ සේව්‍යයන් අවසර නොදීම නිසා හිරිහැරකාරී තත්ත්වයන්ගෙන් බේරී යාමට හෝ ඔවුන්ගේ ගිවිසුම් සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු සිය රටවල් පවා යාමට හැකියාවක් නොලද සේවක සේවිකාවන් සම්බන්ධ සිද්ධි රාශියක් හියුමන් රයිට්ස් වොච් සංවිධානය ලේඛනගත කර ඇත.

ගෘහ සේවක සේවිකාවන් පීඩා විඳිනුයේ කම්කරු හා ආගමන නීතිවල අඩුපාඩුවලින් පමණක් නොවේ. ශ්‍රමය අපනයන කරන රටවල් හා සෞදි අරාබිය යන දෙවර්ගයේ ම යෝධ, ලාභය සොයන හා දුර්වල නියාමණයකින් යුත් ශ්‍රමිකයන් බඳවා ගැනීමේ කර්මාන්තයක අඩුපාඩු ද වලිනි. පසුගිය දශක කීපය තුළ සංක්‍රමණික ගලනය නම් කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, ආසියාවේ සේවියන් බඳවා ගැනීමේ හා ඔවුන් මැද පෙරදිග සේව්‍යන්ට සැපයීමේ ව්‍යාපාරය ව්‍යාප්ත වී ගියේ ය. ශ්‍රමිකයන් යවන රටවල බඳවා ගන්නන් විශාල ගාස්තු අය කර ගන්නා අතර වැඩ කරන තත්ත්වයන් පිළිබඳව අසම්පූර්ණ හෝ නොමග යාමට තොරතුරු සපයති. ඉන්දුනීසියාවේ ස්ත්‍රීන් හා ගැහැණු මාස ගණන් බලහත්කාර රඳවා ගැනීම්වලට භාජනය කරන අතර, පුහුණු මධ්‍යස්ථානවල පිටත්වීම් පූර්ව වෙනත් අකටයුතුකම්වට භාජනය කෙරේ. ගෘහ සේවියන් අධාර ඉල්ලා කළ ඉල්ලීම් සෞදි අරාබියෙහි රැකියා ඒජන්තවරුන් නොසළකා හැරී හෝ ප්‍රතික්ෂේප කළ අවස්ථා රාශියක් ද, සේවියන් සිය රට බලා යාමට අපේක්ෂා කළ විට ආපසු යැවීමේ වියදම් මග හැරීම පිණිස එසේ ආපසු යවනවා වෙනුවට වෙනත් සේව්‍යයන් වෙත මාරු කළ අවස්ථා රාශියක් ද හියුමන් රයිට්ස් වොච් සංවිධානය ලේඛන ගත කර ඇත.

විදෙස් සේවියන්ගේ අනුග්‍රහකයන් ලෙස සේවය කරනු ඇති විශාල බඳවා ගැනීමේ ආයතන තුනක් හෝ හතරක් ඇති කිරීම මගින් කෆාලා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමට සෞදි ආණ්ඩුව සලකා බලමින් සිටී.

මෙම විකල්පය සේව්‍යයා පදනම් කරගත් අනුග්‍රහකත්වය ක්‍රමයක ඇතැම් නෛසර්ගික ප්‍රශ්න විසඳයි. එසේ වුවද සංක්‍රමණික සේවයන්ගේ ජීවිත මත අති විශාල පාලනයක් නිසොල්මනේ ක්‍රියාත්මක කරනු ඇති විශාල ආයතන කීපයක පාලනය යටතේ ලාභදායි කර්මාන්තයක් සංකේන්ද්‍රණය කිරීම මගින් නව අභියෝගයක් ඉදිරිපත් කරනු ඇත. බඳවා ගැනීමේ නියෝජිතයන් විසින් සංක්‍රමණික සේවියන් දූෂණයට හා අකටයුතුකම්වලට පාත්‍ර කරනු ලැබීම වැළැක්වීම පිණිස එවැනි ඕනෑම ප්‍රතිසංස්කරණයක් බරපතල හා ස්වාධීන නියාමනයක් සඳහා වන යාන්ත්‍රණයන් ද ඇතුළත් වීම සංක්‍රමණික සේවයන්ගේ අයිතිවාසිකම් රැකීමේ සංවරණයක් හා තුලනයන් (checks and balances) ඇතුළත් කර ගත යුතුයි.

## ගෘහ සේවියන්ට එරෙහි අකටයුතුකම් හා හිංසා.

බොහෝ ගෘහ සේවියන්ය ඔවුන් හොඳින් සලකන, ඔවුන්ට විධිමත් ලෙස ගෙවීම් කරන හා යෝග්‍ය වැඩ කිරීමේ තත්ත්වයන් සහතික කරන වගකිව යුතු සේව්‍යයන් ලැබෙන්නට පුළුවන. මෙම සේවියන්ගේ අත්දැකීම්බ බොහෝ විට තමන්ගේ රටවල් තුළ විදේශයන්හි තිබෙන ලාභදායි හා සිත් ඇලලන රැකියා පිළිබඳ පුළුල්ව පැතිරුණු අදහසේ පදනම සකස් කරයි. අවාසනාවකට අවම ශිෂ්ඨ සම්පන්න වැඩ ප්‍රමිතීන් සැපිරෙන තත්ත්වයක් සොයා ගැනීම බොහෝ විට වාසනාව පිළිබඳ කරුණක් මිස සහතිකයක් නොවේ. එතරම් වාසනාවන්ත නොවන්නා වූ පිටවීමේ විකල්ප ස්වල්පයකින් යුත් ඉහළම සූරාකෑමේ තත්ත්වයන් ගේ උගුලේ අසුවෙයි.

ඇතැම් සේව්‍යයන් සංක්‍රමණික ගෘහ සේවියන්ගේ නෛතික තත්ත්වය සම්බන්ධ ඔවුන්ගේ පාලනය හා සෞදි කම්කරු නීති යටතේ බැඳීම්වලින් ඔවුන්ට ඇති නිදහස තමන්ගේ වාසියට උපයෝගි කර ගනිති. ගෘහ සේවියන් සමග, ශ්‍රමිකයන් යවන රටවල තානාපති නිලධාරීන්, යන සෞදි නිලධාරීන් සමඟ කළ සම්මුඛ සාකච්ඡා මගින් අවධාරණය වූ ඉතාමත් පොදු පැමිණිල්ල ලෙස ඉදිරිපත් වූයේ වැටුප් නොගෙවීම හා වැටුප් අඩුවෙන් ගෙවීම ය. ඊට අමතරව බොහෝ ස්ත්‍රීන් වාර්තා කළේ ඔවුන්ට ලැබුණ වැටුප් තම රටවල දී අත්සන් කළ ගිවිසුම්වල දී පොරොන්දු වූ මුදලට වඩා පහළ බව ය.

සේව්‍යයන් විසින් හා සමහර අවස්ථාවල දී රැකියා ඒජන්තයින් විසින් ශාරීරික හා මනෝවිද්‍යාත්මක වශයෙන් හිරිහැරයට පත් කෙරුනු අවස්ථා ගණනාවක් අපි ලේඛන ගත කළෙමු. හිරිහැර පිළිබඳ නිර්දේශයන්ට, පහරදීම්, රත්වූ යකඩ වලින් හිතා මතා කෙරෙන පිලිස්සීම්, තර්ජන, අපහාස හා ගෘහ සේවියාගේ හිස බූගෑම වැනි අපහාසයට ලක් කිරීමේ

ආකාරයන් ඇතුළත්ව ඇත. නොසෑහෙන ආහාර දීම ද පොදු අපයෝජනයකි. පිරිමි සේව්‍යයන් විසින් නැතිනම් ඔවුන්ගේ පුතුන් විසින් සමහර අවස්ථාවලදී උපකාර සඳහා පිහිට පතා සමීප වූ වෙනත් විදේශ සේවකයන් විසින් දූෂණයට ලක්කළ, දූෂණය කිරීමට තැත් කළ, ලිංගික හිරිහැරයට ලක්කළ ස්ත්‍රීන් සම්මුඛ සාකච්ඡාවන්ට අපි බඳුන් කළෙමු. තානාපති කාර්යාල වාර්තා කළේ මෙම පැමිණිලි සහිතව ස්ත්‍රීන් ස්වල්පයක් පමණක් සෞදි අධිකාරීන් වෙත පැමිණීමට හේතු වූයේ පරපුරුෂ සේවනයේ යෙදීම, අවිවාහක මෛථුනයේ යෙදීම, හෝ වෙනත් සදාචාර අපමාචාරයක් සම්බන්ධයෙන් ඔවුන්ටම නඩු පැවරීමේ අවදානම පැවතීම නිසා බව ය.

තානාපති කාර්යාල සහ සෞදි සමාජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වෙත ලැබුණු ඉතා පොදු පැමිණිලිවලින් එකක් වූයේ, “වැඩ අධිකත්වය ය.” බොහෝ ගෘහ සේවියන් වාර්තා කළේ පැයක විවේකයක් හෝ කිසිඳු විවේකයක් නැතිව දවසකට පැය 15 - 20 ක් වැඩ කිරීමට සිදුව තිබෙන බව ය. සම්මුඛ සාකච්ඡාවට ලක් වූ කිසිවෙකුට දවස නිවාඩුවක් හෝ වැටුප් සහිත නිවාඩු ලැබී නැත. රාමසාන් සමයේ වැඩ බර හා වැඩ පැය ගණන නියත වශයෙන් ම වැඩි කෙරේ. අසනීපව සිටින විට හෝ තුවාල වී සිටින විට පවා වැඩ කළ යුතු බවත් සෞඛ්‍යාරක්ෂණය ලැබුණේ ඉතා අඩුවෙන් බවත් ගෘහ සේවියෝ වාර්තා කළහ. තව ද බොහෝ ගෘහ සේවියන් විශාල ගෙවල්වල සේවයේ නියුතු වුව ද කියා සිටියේ ජීවත්වීමට සුදුසු පහසුකම් නොමැති බව ය. ඔවුන්ට නිදා ගැනීමට ලැබෙනුයේ කුඩා ගබඩා කාමරවල ය. එක් සිද්ධියකදී නාන කාමාරක ය.

සෞදි ආගමන ප්‍රතිපත්තියට අනුව සේව්‍යයන් ආපසු සියරට යාමට අපේකෂා කරන සංක්‍රමණික සේවියන් සඳහා පිටවීමේ වීසාවක් අත්සන් කළ යුතුය. බොහෝ සේව්‍යයෝ ගෘහ සේවින්ට මාස ගණන් හෝ අවුරුදු ගණන් ඔවුන්ගේ කැමැත්තට එරෙහිව දිගටම වැඩ කිරීමට බල කරමින් මෙම පිටවීමේ වීසා අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරති. තවත් අවස්ථාවල සංක්‍රමණික රක්ෂාස්ථානයක නැවතී සිටීනම් මුල් සේව්‍යයෝ සංක්‍රමණික පිටවීමේ වීසා අත්සන් කිරීම මාස ගණන් දික් ගස්සති. සේව්‍යයෝ සේවින්ට ඔවුන්ගේ කැමැත්තට එරෙහිව ඔවුන්ගේ වැඩ දිගටම කරගෙන යන්නට බල කරන විටදී ඔච්නුව සූරාකෑමේ වැඩ තත්ත්වයන්ට භාජනය කරති. ශාරීරික හෝ ලිංගිකව හිංසනයට පත් කරති. ඔවුන්ගේ වැටුප් නොගෙවා සිටිති. වැඩ කරන ස්ථානයේ සිර කර දමති. මෙම ස්ත්‍රීන් සිටිනුයේ බලහත්කාර ශ්‍රමයේ හා බොහෝවිට වහල්භාවයේ තත්ත්වයන් යටතේ ය.

සංක්‍රමණික ගෘහ සේවියන්ගේ හුදෙකලාව, මූල්‍ය පීඩනය හා උපකාර ලබා ගැනීම සඳහා ඇති සීමා සහිත ඉඩට සාධක කීපයක් දායක වී ඇත. ගෘහ සේවියන්ට මේ පීඩා කාරී තත්ත්වයන්ගෙන් පිටවීමේ මාර්ගයක් පෙනෙන්නේ නැත. මන්ද වැඩ කිරීමේ බලපත්‍ර තනි තනි සේව්‍යයාට බැඳ දමනු ලැබ ඇති නිසා ය. රැකියාව හැර යාම හෝ නැතිවීම යන්නෙහි නියම තේරුම වන්නේ ක්ෂණික ආපසු යැවීම ය. බොහෝ සේව්‍යයෝ තමන් ගේ ගෘහ සේවියන්ගේ ගමන් බලපත්‍ර හා වැඩ බලපත්‍ර පැහැර ගනිති. එහි තේරුම පීඩාකාරී තත්ත්වයන්ගෙන් පැන යන ස්ත්‍රීන් හා ගැහැණු ළමුන් අත් අඩංගුවට ගැනීමට හා ආගමන රඳවා ගැනීමට මුහුණ දිය යුතු බව ය. අප සම්මුඛ සාකච්ඡාවලට භාජනය කළ සෑම ගෘහ සේවියකගේම ගමන් බලපත්‍ර හා වැඩ බලපත්‍ර සේව්‍යයෝ පැහැර ගනිති. බොහෝ අවස්ථාවල සෞදි අධිකාරියේ හෝ තානාපති නිලධාරීන් මැදිහත්වීමෙන් පසු පවා ඔවුහු ඒවා ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කර ඇත. එසේ ම ඇතැම් සේව්‍යයෝ ගෘහ සේවියන්ට දුරකතන ඇමතුම් දීමෙන් හා ලබා ගැනීම අසල්වැසියන් සමඟ කතා බහ කිරීම, වැඩ කරන ස්ථානයේ ස්වාධීනව පිටවීම සීමා කරති. හියුමන් රයිට්ස් වොච් විසින් සම්මුඛ සාකච්ඡාවන්ට ලක් කළ ගෘහ සේවියන්ගේ බහුතරය වාර්තා කළේ ඔවුන්ගේ සේව්‍යයන් ගෙදර නැති වූයේ නම් ඔවුන් වැඩ කරන ස්ථානයේ රඳවා පිටතින් අගුළු ලා දමන බව ය. කීප දෙනෙක් කියා සිටයේ ඇතැම් අවස්ථාවල නිදන කාමරවල හෝ නාන කාමරවල දවස් ගණන් අගුළු ලා සිටි බව ය.

## පිළියම් යෙදීමේ දුර්වල යාන්ත්‍රණයන්.

සෞදි ආණ්ඩුවට සහ ශ්‍රමිකයන් යවන රටවල විදේශීය දූත මණ්ඩලවලට සෑම වසරකම ගෘහ සේවියන්ගෙන් පැමිණිලි දහස් ගණනින් ලැබේ. අපේ පර්යේෂණ පෙන්නුම් කරන්නේ බොහෝ ගෘහ සේවියන්ගේ ප්‍රශ්න වාර්තා නොවී තිබෙන්නේ පෞද්ගලික නිවාසවල හුදෙකලාව තැබීම, සිය කැමැත්තට අනුව සේවියන් ආපසු යැවීමට සේව්‍යයන්ට ඇති හැකියාව සහ නිල උපකාරය අපේක්ෂා කිරීමට ප්‍රමාණවත් ඉඩක් නොසැලසෙන දුර්වල ලෙස ක්‍රියාත්මක කෙරෙන පිළියම් යෙදීමේ යාන්ත්‍රණයන් හේතු කොට ගෙන බව ය.

සෞදි අධිකාරීන් හෝ විදේශ තානාපති කාර්යාල වෙත ලැබෙන එම පැමිණිලි සම්බන්ධයෙන් ගත් කළ ශ්‍රම සූරාකෑමට හා ගෘහ සේවියන්ට එරෙහි අපරාධමය හිංසනයන්ට ලැබෙන ප්‍රතිචාරය ඒ මොහොතට පමණක් වන අතර එම පැමිණිලි හිංසා පීඩා සිය වැටුප් හිමිකම් හා ආපසු සියරට යාම සම්බන්ධයෙන් ඇතැම් ගෘහ සේවියන්ට උපකාරීවීමට සෞදි අධිකාරීන්ට හැකි වී ඇති නමුත් ඇතැම් අවස්ථාවලදී ඔවුන් ගෘහ සේවියන් පීඩාකාරී තත්ත්වයන් වෙත ආපසු යවා ඇත. සේවියන් ඉදිරිපත් කරන ලද ප්‍රති චෝදනා මත පදනම් ව සේවියන්ට නඩු

පවරා ඇත. නැතහොත් සේවායයන් හා සේවියන් අතර අසාධාරණ එකඟතාවන් ඇති කිරීම සඳහා සාකච්ඡා කර ඇත. කේවල් කිරීමේ ශක්තියේ වෙනස නිසා සාකච්ඡාවෙන් එලඹි එකඟතාවයන් හි දි ගෘහ සේවියන් නිතරම වාගේ ආපසු සිය රට එන්නේ ඔවුන්ගේ සම්පූර්ණ වැටුප නොමැතිව හෝ අනෙකුත් හිංසා පීඩාදියට පිළියමක් නැතිව ය.

සමාජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය රියාද්වල පිටවීමේ වීසා, ආපසු යාමේ ටිකෙට්පත්, හඳුනා ගැනීමේ ලේඛන අවශ්‍ය කරන හා සිය සේවායයන් සමඟ වැටුප් ආරවුල් තිබෙන ගෘහ සේවියන් සඳහා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යයි. මෙම මධ්‍යස්ථානය ගෘහ සේවියන්ට ආගමන හා ශ්‍රමික ප්‍රශ්න විසඳීමේ යාන්ත්‍රණයක් සපයා දීමේ දී වැදගත් පියවරක් ඉදිරියට තබා ඇත. කෙසේ වුවද එහි ක්‍රියාකාරකම්වල පැති කීපයක් අවධානය මතු කරයි. ගෘහ සේවියෝ නිතරම වාගේ අසාධාරණ මූල්‍ය එකඟතාවන්ට එළඹෙන අතර තමන්ගේ නඩු සම්බන්ධ තොරතුරු බිඳක් පමණක් ඇති තදබදයෙන් රක්ෂාස්ථානවල මාස ගණන් රැඳී සිටිති.

සංක්‍රමණික ගෘහ සේවියෝ ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙති. ඔවුහු සෞදි අරාබියේ අපරාධ යුක්ති ක්‍රමය සමඟ ගැටුමකට මුහුණ දෙති. පරිවර්තන ලබා ගැනීමේ, නීති ආධාර ලබා ගැනීමේ අසමාන හෝ බරපතල ලෙස ප්‍රමාදවීමේ තත්ත්වයන්ට මුහුණ දෙති. ඔවුන් කොන්සල් කාර්යාල සමඟ සම්බන්ධයේ දී ද තත්ත්වය එසේ ය. යහපත් සැලකීම් ආවරණය කර ගැනීමේ ප්‍රයත්නයන්හි දී ඔවුන්ගේ සේවායයන්ගෙන් එල්ල වන සොරකම් කිරීම් පිළිබඳ ව්‍යාජ ප්‍රති චෝදනා නැතහොත් මායා කර්මවලට මහුණ දෙති. නෑදෑ සම්බන්ධයක් නැති පිරිමින් සමඟ කැමැත්තෙන් සිදුවන ලිංගික සබඳතා අපරාධයක් ලෙස හඳුන්වා වෙනස් කොට සැලකීමේ හා කර්කශ සදාචාර නීතිවලට මුහුණ දෙති. බලහත්කාර මෛථුනයේ හෝ ලිංගික හිංසනයේ ගොදුරු බවට පත්ව සිටින එහෙත් දැඩි ශාරියා (Sharia) සාක්ෂිමය ප්‍රමිතීන්ට අනුව එය ඔප්පු කිරීමට නොහැකි ගෘහ සේවියන් අසභ්‍ය ලිංගික හැසිරීම හෝ පරපුරුෂ සේවනය සම්බන්ධයෙන් නඩු පැවරීමට ද භාජනය විය හැකි ය. මේ පරාසයේ අපරාධයන් සඳහා වන දඬුවම්වලට සිරගත කිරීම, කසපාර දීම හා සමහර අවස්ථාවල මරණ දණ්ඩනය දීම ද ඇතුළත් ය.

ගෘහ සේවියන්ට එරෙහිව සිදු කරන හිංසා පීඩාදිය සම්බන්ධ නඩු කරගෙන යාම සඳහා සෞදි අරාබියෙහි නියමිත පටිපාටියක් හෝ ක්‍රමයක් නොමැති යයි තානාපති කාර්යාල නිලධාරීහු පැමිණිලි කරති. එක් තානාපති කාර්යාල නිලදාරියෙක් නම හෙළි නොකරන ලෙස ඉල්ලා සිටිමින් මෙසේ කීය. “ප්‍රමිතියක් ඇත්තේ නැත. රියාද්වලින් පිටත ස්ත්‍රීන්ට ස්ත්‍රීන් සඳහා

පටිපාටිය මෙය යයි ඔබට කියන්නට අපට නොහැකි ය. මන්ද සෑම එකක්ම සුවිශේෂී එකකි. පටිපාටියක් නොමැති නිසා හැම වෙලාවෙම වෙනස් විසඳුමක් ඇත."

හිංසා පීඩාදියේ පාත්‍රිකයන් සම්බන්ධයෙන් පලදායි දේශිය පිළියම්කාරක යාන්ත්‍රණයක් නොමැති වීම තුළ ශ්‍රමිකයන් යවන රටවල විදේශිය ධූත මණ්ඩල තමන්ගේ ජාතිකයන්ගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටීමේ දී හා රක්ෂාස්ථාන නීති ආදාර සැපයීමේ දී හා සේව්‍යන්ගෙන් නොගෙවන ලද වැටුප් ඉල්ලීමේ දී තීරණාත්මක කාර්යභාරයක් රඟපායි. ඉන්දුනිසීයාවේ, ශ්‍රී ලංකාවේ, පිලිපීනයේ, නේපාලයේ හා අනෙකුත් ශ්‍රමිකයන් යවන රටවල දූත මණ්ඩල ධාරිතාව හා ඒවායින් දෙන ආධාරය ඉතාමත්ම විවිධ ය. බොහොමයක්, ප්‍රමාණවත් නොවන මූල්‍ය සම්පත් හා කාර්ය මණ්ඩල ඇතිව පැමිණිලිවල ඉහළ ප්‍රමාණයක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ප්‍රයත්න දරයි. එසේ වුවද මෙම දූත මණ්ඩල බොහෝ අවස්ථාවල ප්‍රමුඛ ආධාරයක් ලබා දීමට සමත් වුවද උපකාර සඳහා ඒවා වෙත සමීප වන ගෘහ සේවියෝ තම නඩු සම්බන්ධ ස්වල්ප තොරතුරක් සඳහා දිගු කාලයක් බලා සිටීම සම්බන්ධයෙන් පැමැණිලි කරයි. ඉන්දුනීසියානු හා ශ්‍රී ලංකා තානාපති කාර්යාල විසින් පවත්වාගනෙ යනු ලබන රක්ෂාස්ථාන සනීපාරක්ෂා නොවන තත්ත්වයන්ගෙන් යුත් හා ඉතාමත්ම තදබදයෙන් යුත් ඒවා ය. පැමිණිලි සැලකිය යුතු සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ක්‍රියාකර තිබියදීත් නේපාල තානාපති කාර්යාලය විසින් පවත්වාගෙන යන රක්ෂාස්ථානයන් ඇත්තේ නැත.

මෙම වාර්තාවෙහි ලේඛනගත කර ඇති හිංසා පීඩා වර්ගයන්ට ප්‍රතිචාර වශයෙන් ඇතැම් ශ්‍රමික අපනයන රටවල් සෞදි අරාබියට ස්ත්‍රීන් යාම පරීක්ෂණයට භාජනය කර තිබේ. නැතහොත් තහනම් කරන්නට ඉල්ලා තිබේ. කෙසේ වුවද අත්දැකීම පෙන්වනුයේ එවැනි තහනම් කිරීම් බොහෝවිට මග පාදනු ඇත්තේ ස්ත්‍රී සංක්‍රමණය, ඔවුන් විශාල අවදානමකට ඇද දැමිය හැකි අඩු ආරක්ෂිත, නීති විරෝධී මාර්ග ඔස්සේ සිදුවීම පමණි. අනෙක් අතට රැකියා සපයන සෞදි අරාබිය හා අනෙකුත් රටවල් සංක්‍රමණික ක්‍රමය මත ඔවුන්ගේ රඳා පැවැත්ම අඩු කිරීමට හෝ ගලා ඒම පාලනය කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් සීමා පනවන ලද ආගමන ප්‍රතිපත්ති හඳුන්වා දීමට උත්සාහ කර තිබේ.

මනා, අයිතීන් පදනම් කරගත් සංක්‍රමණික ප්‍රතිපත්තියක් සංවර්ධනය කර බලාත්මක කිරීම සඳහා වඩා විශාල බහු පාර්ශවීය හා කලාපීය සහයෝගීතාව අත්‍යවශ්‍ය වේ. පවතින අසමාන කේවල් කිරීමේ බලය ශ්‍රමිකයන් යවන හා ශ්‍රමිකයන් ලබා ගන්නා රටවල් අතර ද්විපාක්ෂික එකගතා දුර්වලවීමේ නැමියාවක් පෙන්වයි. කොළඹ ක්‍රියාවලිය, අබුඩාබි සංවාදය, සහ

සංක්‍රමණය හා සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදය වැනි ඒවා තුළ සංක්‍රමණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ආණ්ඩු එකට ගෙන එන්නාවූ නැගී එන මුල පිරුම්වලට සංක්‍රමණික ගෘහ සේවකයන්ගේ අයිතීන්ට ආමන්ත්‍රණය කිරීමේ වැදගත් මාධ්‍යයක් ලෙස සේවය කිරීමේ ශක්‍යතාවක් තිබේ. මෙම රැස්වීම් එක්සත් ජාතීන්ගේ ක්‍රියාවලින් සමග වඩා බලගතු සබඳතා ගොඩ නගා ගත යුතු අතර පවත්නා මානව හිමිකම් ගිවිසුම් හා සංක්‍රමණිකයන් පිළිබඳ මාර්ගෝපදේශ මත ඒකාබද්ධ කිරීම හා ගොඩනැගීම කළ යුතුය.

## සෞදි අරාබියේ ආණ්ඩුව වෙත වන ප්‍රධාන නිර්දේශ.

සංක්‍රමණිකයන්ට එරෙහි තාඩන පීඩන අවසන් කිරීමේ යතුර වනුයේ සංක්‍රමණ අවසන් කිරීමෙන් නොවේ, දැනුවත් වරණයක් පදනම මත ගෘහ සේවකයන් සංක්‍රමණය වීමේ හා ඔවුන්ගේ අයිතිවාසිකම් සහතික කිරීමේ ප්‍රමාණවත් ආරක්ෂණයෙන් සැපයීම ය. ගෘහ සේවියන්ට එරෙහි සිදුවන බොහොමයක් තාඩන පීඩන වැළැක්විය හැකි ඒවා ය. ඒවා සිදු කෙරෙන විට ආණ්ඩුවලට ඊට වගකිවයුතු වරදකරුවන් අල්ලා ගැනීමට ගත හැකි පැහැදිලි පියවර තිබේ.

## හියුමන් රයිට්ස් වොච් සංවිධානය සෞදි අරාබි ආණ්ඩුව වෙත කරන නිර්දේශ.

- සේවියන්ගේ වීසා තවදුරටත් තනි තනි අනුග්‍රාහකයන්ට බැඳ නොතබන සේ හා ඔවුන්ගේ කැමැත්තට අනුව රැකියා මාරු කිරීමට හෝ රටෙන් පිටව යාමට හැකිවන සේ වීසා අනුග්‍රාහකත්ව ක්‍රමය ප්‍රතිසංස්කරණය කළ යුතුය.
- කම්කරු ආරක්ෂණය ගෘහ සේවියන් සඳහා ද දීර්ඝ කරමින් 2005 කම්කරු නීති සංග්‍රහයට යෝජිත ඇමුණුම ඇතුලත් කරන්න. අනෙක් කම්කරුවන්ට සපයන පරිදි මේවා ඔවුන්ට සමාන තත්ත්වයෙන් ක්‍රියාත්මක වීම සහතික කරන්න. ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා කාල රේඛාවක් හා මෙවලම් නිර්මාණය කරන්න.
- ගෘහ සේවියන්ගේ වැඩ කිරීමේ තත්ත්වයන් නියාමනය කිරීමට, මුදවා ගැනීම් පහසුකරණය කිරීමට, නොගෙවන ලද වැටුප් අය කර ගැනීමට, සිය රටවලට ආපසු යාම කලට වේලාවට පිළියෙල කර ගැනීමට ශ්‍රමිකයන් එවන රටවල් සමග සහයෝගයෙන් වැඩ කරන්න.
- සමාජ කටයුතු අමාත්‍යාංශය මගින් මෙහෙයවන ගෘහ සේවියන් සඳහා වන මධ්‍යස්ථාන සඳහා පහසුකම් හා නීති හා චර්යා පද්ධතීන් දියුණු කරන්න.

- රඳවා ගෙන තිබෙන පිළිබඳව ශ්‍රමිකයන් යවන රටවලට දැනුම් දීමට, තාඩන පීඩනවලින් ගලවාගත් අය සඳහා සෞඛ්‍යාරක්ෂණය, උපදේශනය හා නීති ආධාර ඇතුළු රක්ෂාවරණ ස්ථාන නිර්මාණය කිරීමට එම රටවල් සමග සහයෝගී වන්න.
- අප්‍රකාශිත පරීක්ෂාවට ලක් කිරීම් ඔස්සේ කෙරෙන නියමයන් ඇතුළුව ශ්‍රමිකයන් සපයන ඒජන්සි ආයතන හා බඳවා ගැනීමේ භාවිතයන් නියාමනය කරන නිත්‍ය හා ස්වාධීන නියාමන යාන්ත්‍රණයන් ස්ථාපිත කරන්න.

**සංක්‍රමණිකයන් යවන රටවල (ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව, පිලිපීනය හා නේපාලය ඇතුළු) ආණ්ඩු වෙත කරන ප්‍රධාන නිර්දේශ:**

- සෞදි අරාබියේ තානාපති කාර්යාලවල හා කොන්සියුලර් කාර්යාලවල සංක්‍රමණික ගෘහ සේවියන් සඳහා රක්ෂාවරණ ස්ථානවල ගුණය, උපදේශන සැපයීම, පුහුණු කාර්ය මණ්ඩල සංඛ්‍යාව ඇතුළු සේවාවන් දියුණු කරන්න.
- අප්‍රකාශිත පරීක්ෂාවට ලක් කිරීම් ඔස්සේ කෙරෙන නියාමනයන් හා ප්‍රතිඵලදායී පැමිණිලි යාන්ත්‍රණයන් ඇතුළුව බඳවා ගැනීමේ නියෝජිතයන් සම්බන්ධ රෙගුලාසි හා නියාමනය ශක්තිමත් කරන්න.
- අපේක්ෂිත සංක්‍රමණික ගෘහ සේවියන් සඳහා දැනුවත් බව නගාලීමේ රජ්‍ය වැඩසටහන් ව්‍යාප්ත කරන්නත පෙර-පිටත්වීම් පුහුණු වැඩ සටහන් වැඩි දියුණු කරන්න.

**විස්තරාත්මක නිර්දේශයන් පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් මෙම වාර්තාව අවසානයේ එයි.**

# XII. විස්තරාත්මක නිර්දේශ

සමාජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් රක්ෂාවරණ ස්ථාන පිහිටුවීම මගින්, කම්කරු නීති සංග්‍රහයට සංශෝධනය යෝජිත කිරීම මගින් හා ගෘහ සේවියන්ට වඩා හොඳින් සැලකීම පිළිබඳ රාජ්‍ය සේවා පණිවිඩ මගින් පෙන්නුම් කර ඇති පරිදි සෞදි ආණ්ඩුව ගෘහ සේවියන්ට එරෙහි හිංසා පීඩාදිය පිළිබඳව යම් අවධානයක් පෙන්වා තිබේ. එසේ වුවද තව බොහෝ ක්‍රමානුකූල හා සමාජ වෙනසක් අවශ්‍ය කෙරේ.

සංක්‍රමණික ස්ත්‍රීන්ට ඔවුන්ගේ රැකියා පිළිබඳව නිවැරදි සම්පූර්ණ තොරතුරු ලබා ගැනීම, ඔවුන්ට තේරුම් ගත හැකි භාෂාවකින් ඔවුන්ගේ ගිවිසුම්වල පිටපත් ලබා ගැනීම හා අවශ්‍යවේ නම් සහාය සඳහා මාවත් සැලසීම සහතික කිරීමේ තීරණාත්මක සාධකයක් වන්නේ ශ්‍රමිකයන් යවන රටවල් හා සෞදි අරාබිය යන දෙපාර්ශවයේම බඳවා ගැනීමේ ක්‍රමයන්හි ප්‍රතිසංස්කරණය. කම්කරු හා ආගමන ප්‍රතිපත්තිවල විපර්වර්තනය ද ප්‍රධාන කරුණකි. වර්තමානයේ කෆාලා ක්‍රමය සහ කම්කරු නීතිවලින් ගෘහ සේවියන් බැහැර කර තිබීම සංක්‍රමණික ගෘහ සේවියන් සුරාකෑමේ ඉහළ අවදානමක් තුළ තබා ඇත. අවසාන වශයෙන් සෞදි ආණ්ඩුව ඇති තරම් අවාසනාවන්තව සිටින ගෘහ සේවියන්ට තාඩන පීඩන මුහුදීමේ හැකියාව හා එසේ යුක්තිය ඉටුවීම සහතික කිරීමට අපරාධ යුක්ති විනිශ්චය ක්‍රමයෙහි, කම්කරු ආරාවුල් යාන්ත්‍රණයන්හි හා සිය රටවලට ආපසු යැවීමේ මාර්ගයන් හි යෝධ වැඩි දියුණු කිරීම් ක්‍රියාවට නැගිය යුතු ය.

## සෞදි අරාබියේ ආණ්ඩුව වෙත.

*ගෘහ සේවියන්ට සමාන හා විස්තීරණ නෛතික ආරක්ෂණයක්, එවැනි ආරක්ෂණයක් භාවිතයට නැගීම සඳහා වන කාල රේඛාවක් හා ක්‍රියාත්මක කිරීමේ මෙවලම් සපයන්න.*

- ගෘහ සේවියන්ට ආරක්ෂාවන් ව්‍යාප්ත කිරීම පිණිස කම්කරු නීතියට යෝජිත ඇමුණුම ඇතුළත් කරන්න. වැඩ කිරීමේ පැය ගණන, වැටුප් ගෙවීම, අතිකාල වැටුප්වලින් කෙරෙන අඩු කිරීම්, සතිපතා විවේක දිනයක්, වැටුප් සහිත නිවාඩු සහ කම්කරු වන්දි පාලනය කරන විධි විධාන ඇතුළත්ව අනෙකුත් සේවියන්ට සපයා ඇති

ආරක්ෂණයන්ට සමාන ආරක්ෂණයන් මෙම සංශෝධනය මගින් සහතික කිරීම තහවුරු කරන්න.

- යෝජිත ඇමුණුම කම්කරු උසාවි මගින් යුක්තියුක්ත කළ හැකි බව සහතික කරන්න.
- වැටුප් ආරවුල් හා අනෙකුත් සේවක ප්‍රශ්න විසඳා ගැනීමට ගෘහ සේවියන්ට කම්කරු උසාවි වෙත පිවිසීමට ඇති ඉඩකඩ වැඩි දියුණු කරන්න.
- ගෘහ සේවියන්ට ගෙවිය යුතුව තිබෙන ගෙවීම් කඩිනම් කිරීමට අවශ්‍ය කරන සිවිල් පටිපාටි සංග්‍රහයෙහි විධි විධාන ක්‍රියාත්මක කරන්න.
- ගෘහ සේවියක් වැඩට ගන්නා විට දී සෞදි සේව්‍යයන් සඳහා ඔවුන්ගේ නෛතික අයිතීන් හා බැඳීම්, සන්නිවේදන බාධක හා සංස්කෘතික වෙනස්කම් හේතුකොටගෙන ඇතිවන වැරදි තේරුම් ගැනීම් සමග කටයුතු කිරීමේ උපාය මාර්ගයන් හි දී ප්‍රශ්න පැන නගින විට සම්පත් වෙත යොමු කිරීම ඇතුලත් අනිවාර්ය පැහැදිලි කිරීමේ වැඩ සටහන් (mandatory orientation) හඳුන්වා දෙන්න.
- සෞදි අරාබියට පැමිණීමේ සිට ඔවුන්ගේ නෛතික අයිතීන් හා බැඳීම් පිළිබඳව සංක්‍රමණික ගෘහ සේවියන්ට අනිවාර්ය පැහැදිලි කිරීමේ වැඩ සටහන් හඳුන්වා දෙන්න. ප්‍රශ්න සම්බන්ධ කාරනවලදී ඔවුන්ට උදව් අපේක්ෂා කළ හැක්කේ කොහෙන්ද, බැංකු කටයුතුවලදී මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ පුහුණුව, තමන්ගේ පවුල් සමග සම්බන්ධතාවෙන් යුතුව සිටින්නේ කෙසේද යන්න පිළිබඳ තොරතුරු, ඔවුන්ගේ තානාපති කාර්යාලවලින් එන නිලධාරීන්ට හැඳින්වීමක්, තමන්ගේ රටවල අවසර ලැබෙන එහෙත් සෞදි අරාබියේදී අපරාධ ලෙස සැලකෙන කටයුතු වැනි සෞදි නීති පිළිබඳ තොරතුරු ආදිය එවැනි වැඩ සටහන්වලට ඇතුළත් විය යුතු ය.

*සංක්‍රමණික සේවියාගේ නෛතික තත්ත්වය, සේව්‍යයන් වෙනස් කිරීමේ හැකියාව හා ඇගේ සේව්‍යයා වෙත සෞදි අරාබියෙන් පිටවීමේ හැකියාව හා බැඳුන අනුග්‍රාහකත්ව නීති ප්‍රතිසංස්කරණය කරන්න.*

- තාවකාලික සේවා නියුක්තිය පදනම් කරගත් වීසා නිශ්චිත සේව්‍යයෙක් පිළිබඳ නොවන සේ කඟාලා අනුග්‍රහකත්ව ක්‍රමය ප්‍රතිසංස්කරණය කරන්න. නැතහොත් අහෝසි කරන්න. නෛතික තත්ත්වය අහිමිවීමෙන් තොරව හා පළමු සේව්‍යයාගේ අවසරය ලබා ගැනීමෙන් තොරව සේවියන්ට සේව්‍යයන් මාරු කළ හැකිවීම සහතික කරන්න.

- සංක්‍රමණික සේවියන් රට හැර යාමට පිටවීමේ වීසා සඳහා ඔවුන්ගේ අනුග්‍රාහකයන්ගේ කැමැත්ත ලබා ගත යුතුය යන අවශ්‍යතාව අහෝසි කරන්න.
- වර්තමානයේ යෝජනා කර ඇති පරිදි බඳවා ගැනීමේ නියෝජිත ආයතන විදේශ සේවියන්ගේ අනුග්‍රාහකත්වය ලබා ගන්නේ නම් ඒවායේ කටයුතු බරපතල ලෙස නියාමනය කිරීමේ පරීක්ෂණ මණ්ඩලයක් නිර්මාණය කරන්න. මෙම පරීක්ෂණ මණ්ඩලයට මෙහෙයුම් බලපත්‍ර අහෝසි කිරීම, සැලකිය යුතු දඩ නියම කිරීම, අපරාධ නඩු පැවරීම සඳහා යොමු කිරීම ඇතුළු අකටයුතුකම් පිළිබඳ චෝදනා විභාග කිරීමේ, දඩුවම් නියම කිරීමේ බලය තිබිය යුතු ය. ශ්‍රමිකයන් අපනයනය කරන රටවල් හා සිවිල් සමාජය ඇතුළුව සියලු පරදු පාර්ශව (stake holders) නියෝජනයෙන් යුතු මණ්ඩලයක් නිර්මාණය කරන්න.
- ගෘහ සේවියන් නැතිවන විට හෝ ඔවුන්ගේ සේව්‍යයා නම් කිරීමට හෝ හඳුනා ගැනීමට නොහැකි වන විට සේව්‍යයන් කොටු කර ගැනීම පිණිස පහසුවෙන් ප්‍රවේශ විය හැකි හා නිතිපතා යාවත්කාලීන කරන (update) සේව්‍යයන්ගේ හා සේවියන්ගේ දත්ත ගබඩාවක් නිර්මාණය කරන්න.
- සෞදි අරාබියේදී මිය යන සේවියන්ගේ සිරුරු සිය රට යැවීමට බලය දීම සඳහා වන පටිපාටි සරල කරන්න.

*ඒ ඒ ජාතිකයන් රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රමිකයන් යවන රටවල් සමග සහයෝගයෙන් වැඩ කරන්න.*

- රඳවා ගනු ලැබූවන් පිළිබඳව හා නඩු අහන දින වැනි අපරාධ නඩු පවත්වාගෙන යාමේදී මතු වන තත්ත්වයන් පිළිබඳව නිසි කලට හා වියානා ප්‍රඥප්තියේ කොන්සියුලර් සම්බන්ධතාවන්ට අනුව තානාපති කාර්යාලවලට දැනුම් දිය යුතු ය.
- සිය කොන්සියුලර් නිලධාරීන් හා සම්බන්ධ වීමට ඔවුන්ට ඇති අයිතිය නොපමාව සංක්‍රමණික සේවියන්ට දැන්විය යුතු අතර එසේ කිරීමට අවශ්‍ය පහසුකම් සැපයිය යුතු ය.
- තමන්ගේ සේව්‍යයන්ගේ නිවෙස්වල හිර කර ඇති හා ඔවුන්ගේ කැමැත්තට එරෙහිව දිගටම වැඩ කරන්න බලකර ඇති සංක්‍රමණික සේවියන් මුදා ගැනීම සඳහා ශ්‍රමිකයන් යවන රටවල් සමග සහයෝගයෙන් වැඩ කළ යුතු ය.

*එවැනි මුදා ගැනීම්වලට බලය දෙන පටිපාටි සරල කළ යුතු ය. සමාජ කටයුතු අමාත්‍යාංශය විසින් ගෘහ සේවියන් වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන මධ්‍යස්ථාන සඳහා වන පහසුකම් හා නීති චර්යා පද්ධතීන් වැඩි දියුණු කරන්න.*

- තමන්ගේ පවුල්වලට හා තානාපති කාර්යාලවලට කතා කිරීමේ හැකියාව, පිටත ඇවිදින්නට යාම හා ජංගම දුරකතන තබා ගැනීම ඇතුළු සංචලනයේ සන්නිවේදනයේ විශාල නිදහසක් මධ්‍යස්ථානයේ නේවාසිකව සිටින ස්ත්‍රීන්ට ලබා දිය යුතු ය.
- ප්‍රශ්න සම්බන්ධ කටයුතු සැකසීම හා හඳුනා ගැනීම, අනෙකුත් අදාළ සෞදි නිලධාරීන් හා ශ්‍රමිකයන් යවන රටවල තානාපති කාර්යාල සමග තොරතුරු හුවමාරු කර ගැනීම හා ප්‍රවනතා නියාමනය කිරීම පහසු කිරීම සඳහා ලිපි ගොනු පරිඝනකගත කරන්න. තාඩන පීඩන කරන සේව්‍යයන්ගේ හා බඳවා ගැනීමේ නියෝජිතයන්ගේ අප ලේඛන (black list) නිර්මාණය කර හුවමාරු කර ගන්න.
- ගෘහ සේවිකයන්ගේ නඩුවක් හා සම්බන්ධ මොනයම් හෝ සම්මුඛ සාකච්ඡාවක් හෝ මුණගැසීම් සඳහා වෘත්තීය පරිවර්තනයක් සපයන්න. ගෘහ සේව්‍යයන් කතා කරන භාෂාවන්හි ව්‍යක්ත කාර්ය මණ්ඩල සැපයීම සහතික කරන්න.
- ගෘහ සේවියක මුහුණ දෙන සැලකිල්ලට ගත යුතු සියලු ප්‍රශ්න මධ්‍යස්ථානයට ඇතුළු වීමේ දී හඳුනා ගනු ලැබීම සහතික කිරීමට විස්තරාත්මක ඇතුළත් කර ගැනීමේ ආකෘති පත්‍රයක් නිර්මාණය කරන්න.
- විශාල වශයෙන් අසමතලිත කේවෙල් කිරීමේ බලය මගහැරීම පිණිස නොගෙවන ලද වැටුප් හා ආපසු යාමේ ටිකෙට් පතක් සඳහා වන අරමුදල් සම්බන්ධ සාකච්ඡා පිටවීමේ වීසාවක් සැපයීමට සේව්‍යයාගේ කැමැත්ත ලබා ගැනීම සම්බන්ධ කරුණෙන් වෙන් කර ගන්න.
- ඔවුන්ගේ ප්‍රශ්නය පිළිබඳ තත්ත්වය හා ඔවුන්ට ලබා ගත හැකි විකල්ප පිළිබඳව ගෘහ සේවියන් දැනුවත් කරන්න.

*ගෘහ සේවියන්ට සැලකීමේදී පවතින ජාතික නීති උල්ලංඝනය කරන සේව්‍යයන්ට හා රැකියා නියෝජිතයින්ට බරපතල දණ්ඩනයන් පමුණුවන්න.*

- ගෘහ සේවියන්ට එරෙහිව ශාරීරික හා ලිංගික හිංසන ක්‍රියාවට නගන වරදකරුවන් පිළිබඳ පරීක්ෂණ පවත්වා, නඩු අසා දඩුවම් කරන්න.

- ගෘහ සේවියන්ට ආපසු සිය රට යාමට හැකිවන හා දීර්ඝ කාලය පුරා රක්ෂාවරණ ස්ථානවල රැඳී සිටීමෙන් වළකනු පිණිස එවැනි කාරණාවලදී තමන්ගේ අටෝනි බලය තම තමන්ගේ තානාපති කාර්යාලවලට පැවරීමට ගෘහ සේවියන්ට ඉඩ සලසන්න.
- ගෘහ සේවියන්ට එරෙහිව ශාරීරික හා ලිංගික හිංසන ක්‍රියාවට නගන, කම්කරු අයිතිවාසිකම් සහ පවතින නීති උල්ලංඝනය කරන වරදකරුවන් පිළිබඳ පරීක්ෂණ පවත්වා, නඩු අසා දඬුවම් කරන්න.
- හිංසාකාරී හා අපචාරී සේව්‍යයන්ට අනාගතයේ දී ගෘහ සේවියන් කුලියට ගැනීම තහනම් කිරීමෙන් ඔබ්බට යන දඬුවම් වැඩි කරන්න.
- ගෘහ සේවියන්ට එරෙහි හිංසන හා අපචාර හඳුනාගැනීමේ හා පරීක්ෂණ කිරීමේ පුහුණුවක් හා එවැනි තත්ත්වයන්හි දී ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද හා යෝග්‍ය යොමුකිරීම් ලබා දෙන්නේ කෙසේද යන්න පිළිබඳ නීති චර්යා පද්ධතීන් පිළිබඳ පොලිස් නිලධාරීන්ට පුහුණුවක් ලබා දිය යුතු ය. සේවියන්ගේ කැමැත්තට එරෙහිව හිංසාකාරී හා අපචාරී සේව්‍යයන් වෙතට ඔවුන් නැවත නොයැවීමේ වැදගත්කම පිළිබඳව පොලීසියට හා ආගමන අෂිකාරීන්ට අධ්‍යාපනයක් ලබා දිය යුතු අතර සේව්‍යයන්ට හා රැකියා නියෝජිතයන්ට එරෙහිව පැමැණිලි ගොනු කිරීම සඳහා වන පටිපාටි ඔවුන් හොඳින් දන්නා බවට සහතික විය යුතු ය.
- බලහත්කාර මෛථුනය ඔප්පු කිරීම දුෂ්කර කරන සාක්ෂි නීති, වැඩිහිටි සම්මුතික ලිංගික චර්යාව, මායාකර්ම හෝ යක්ෂාරූඪ විජ්ජා (Black magic) යයි කියනු ලබන ඒවා සඳහා දෙනු ලබන හිතුවක්කාර දඬුවම් ඇතුළු අපරාධ යුක්ති විනිශ්චය නීති ප්‍රතිසංස්කරණය කරන්න.

*බඳවා ගැනීමේ නියෝජිත ආයතන පිළිබඳ රෙගුලාසි හා නියාමනය ශක්තිමත් කරන්න.*

- පරීක්ෂකයන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමක් හා අප්‍රකාශිත පරීක්ෂණයන් ඇතුළු බඳවා ගැනීමේ නියෝජිත ආයතන පිළිබඳ වන කම්කරු අමාත්‍යාංශයේ නියාමනය වැඩි දියුණු කරන්න.
- බඳවා ගැනීම්, මාරු කිරීම්, සේව්‍ය/ සේවක ආරාවුල් හැසිරවීම් හා සෞදි අධිකාරීන්ට හා ශ්‍රමිකයන් යවන රටවල තානාපති කාර්යාල වෙත වන යොමු කිරීම් පද්ධති සඳහා වන නීති චර්යා පද්ධතීන් ශක්තිමත් හා වෘත්තීයකරණය කරන්න.
- සේව්‍යයන් කිසි කම්කරු නීති උල්ලංඝනයක් හෝ හිංසා අපචාරයක් නොකර තිබූ විටෙක හා ගෘහ සේවියක් ඇගේ සේවාව කල්තියා නවතා ඇති විටෙක අහිමි වූ බඳවා

ගැනීමේ ගාස්තු අයකර ගැනීමට සේවායයන් සඳහා රක්ෂණ වැඩ සටහනක් ඇති කිරීම ෂලකා බැලිය යුතු ය.

*ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් සමග අනුකූල වන්න.*

- සියළු සංක්‍රමණික කම්කරුවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය (සංක්‍රමණික කම්කරු සම්මුතිය) හා ජාත්‍යන්තර කම්කරු සංවිධාන ප්‍රධාන සම්මුතීන් සීමා කිරීම්වලින් තොරව ස්ථිර කරන්න. ගිවිසුම් ප්‍රකාර වාර්තා කිරීමේ අවශ්‍යතාවන්ට අනුකූල වන්න.
- සේවායයන්, සේවකයන්ගේ ගමන් බලපත්‍ර රඳවා ගැනීමේ භාවිතයන් අහෝසි කිරීම සම්බන්ධයෙන් හා වාර්ගික වෙනස්කම් කිරීම මුලිනුපුටා දැමීම පිළිබඳ කමිටුව හා රඳවා තබා ගන්නා සංක්‍රමණික ගෘහ සේවියන් සඳහා වන කොන්සියුලර් ආරක්ෂණය ප්‍රවේශ වීම සම්බන්ධයෙන් හිංසනයට එරෙහි කමිටුව යන දෙක විසින් දැනටමත් නිකුත් කරනු ලැබ ඇති නිර්දේශයන් සමග අනුකූල වන්න.
- ස්ත්‍රීන්ට එරෙහි සකලාකාර වෙනස්කම් කිරීම් මුලිනුපුටා දැමීම පිළිබඳ ප්‍රඥප්තිය හා ළමා අයිතීන් පිළිබඳ ප්‍රඥප්තිය අරභයා වන පුළුල් සීමා කිරීම් ඉවත් කරන්න.
- සංක්‍රමණික ගෘහ සේවියන්ගේ තත්ත්වය පරීක්ෂා කිරීම පිණිස, සංක්‍රමණිකයන් මානව අයිතිවාසිකම් පිළිබඳ පුද්ගලයන් සහ නීති විරෝධී ලෙස විකිණීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයන්ට රටට පැමිණීමට ආරාධනා නිකුත් කරන්න.

## ශ්‍රමිකයන්ගේ රටවල (ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව, පිලිපීනය හා නේපාලය ඇතුළුව) ආණ්ඩු වෙත.

*බඳවා ගැනීමේ නියෝජිතයන් සම්බන්ධ රෙගුලාසි හා නියාමනය ශක්තිමත් කරන්න.*

- දේශීය තැරැව්කරුවන් හා උප නියෝජිතයන් විසින් කරනු ලබන අධික අය කිරීම් හා රැවටීම් අඩු කිරීම පිණිස ගාස්තු හා බඳවා ගැනීමේ භාවිතයන් සඳහා වන ප්‍රමිතීන් පැහැදිලිව නිර්වචනය කර දක්වන්න. රෙගුලාසි උල්ලංඝනය කරන උප නියෝජිතයන් අර්ථවත් දඩුවම්වලට මුහුණදීමට සිදුවීම සහතික කරන්න.
- සංක්‍රමණය වීමට පෙර බඳවා ගැනීමේ නියෝජිතයන්ට තමන් ගෙවන ලද මුදල් පිළිබඳව ගෘහ සේවියන් විසින් ආණ්ඩුවට වාර්තා කරනු ලැබිය යුතු නියාමන ක්‍රමයක් පිහිටුවන්න.

- සේවයේ නියුතු රටවල රැකියා සංවිධානවල වැඩ කරන සිය ජාතිකයන් පිළිබඳව වන පැමිණිලි බරපතල ලෙස එකතු කර විමර්ශනය කරන්න. සේවයේ නියුතු රටවල විදේශ දූත මණ්ඩල කාර්යාලවලදී හා ආපසු පැමිණීමේදී ගෘහ සේවියන්ට මෙම තොරතුරු ලියාපදිංචි කරවීමට ඉඩ සලසන පටිපාටි නිර්මාණය කරන්න.
- සෞදි අරාබියේ තානාපති කාර්යාලවල හා කොන්සියුලර් කාර්යාලවල සංක්‍රමණික ගෘහ සේවියන් සඳහා සේවා වැඩි දියුණු කරන්න.
- අප ලේඛනගත සේව්‍යයන් හා බඳවා ගැනීමේ නියෝජිත ආයතන සම්බන්ධ තොරතුරු තානාපති කාර්යාල හා සෞදි අධිකාරීන් අතර හුවමාරු කර ගන්න.
- ආධාරය අපේක්ෂා කරන සංක්‍රමණික ගෘහ සේවියන්ට විශේෂයෙන්ම වැටුප් එකතු කර ගැනීමේ, චූදිත හිංසා හා අපචාර සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීමේ හා නීතිය හමුවට පැමිණවීමේ සහ රඳවා තබා ගන්නා විට අයිතීන් බුක්තිවිඳීම් ආදී වශයෙන් වන ක්ෂේත්‍රයන්හි දී සහය වීම පිණිස පුහුණු කාර්ය මණ්ඩල සංඛ්‍යාව වැඩි කරන්න.
- සෞදි අරාබියට යවා ඇති සියලුම මට්ටම්වල කාර්ය මණ්ඩල සඳහා ගෘහ සේවියන්ගේ අයිතීන් හා ඔවුන්ට සහාය වන්නේ කෙසේද යන්න පිළිබඳව අනිවාර්ය පුහුණුවක් හඳුන්වා දෙන්න. සංක්‍රමණික ගෘහ සේවියන් කොන්සියුලර් සහාය ලැබිය යුතුව තිබෙන පුරවැසියන් ය යන්න පිළිබඳව ශක්තිමත් සංඥාවක් තානාපතිවරුන් විසින් යැවිය යුතු ය. ගෘහ සේවියන්ගේ දායකත්වයෙන් හා ඔවුන් සඳහා වන ෂත්කාරක අවස්ථා ඉස්මතු කර දැක්විය යුතු ය.
- කාර්ය මණ්ඩල පුහුණුව, ක්ෂිත උපදේශනය (trauma counseling) හා සෞඛ්‍යාරක්ෂණය සැපයීම හා අධික මිනිස් තදබදය අඩු කිරීම මගින් වාසස්ථානවල හා රැකවල් නිවාසවල තත්ත්වයන් වැඩි දියුණු කරන්න.
- සහාය සඳහා කලින් විදේශ දූත මණ්ඩල හා සබඳතා ඇති කරගත් ගෘහ සේවියන්ගේ සුබසාධනය පිළිබඳව වාරිකව කෙරෙන සොයා බැලීමේ ක්‍රමයක් සංවර්ධනය කරන්න.
- සේවියන්ට සතියකට එක් නිවාඩු දිනයක් සැපයීමට සේව්‍යයන් දිරිමත් කිරීමක් ලබාදීමට සතිපතා කෙරෙන පුහුණුවක් හෝ අරාබි පංති පැවැත්වීම වැනි සේවා සපයන්න.
- විදේශ දූත කාර්යාලවල පැය 24 හදිසි ඇමතුම් දුරකතන පහසුකම් හා/ හෝ හිංසා අපචාර සිදුවන වැඩ කරන ස්ථානවලින් පලා එන ගෘහ සේවියන් සඳහා පැය 24 සේවාවක් සැපයීම සහතික කරන්න.

*ගෘහ සේවියන් සඳහා පෙර-පිටත්වීම් පුහුණු වැඩ සටහන් වර්ධනය කරන්න.*

- අයිතීන් පිළිබඳව දැනුවත්භාවය හා පුහුණු කටයුතුවල විදේශ භාෂා අංග වැඩි කරන්න.
- සේවයේ නියුතු රටවල මෙන්ම ආපසු පැමිණීමෙන් පසුවද, සේව්‍යයන්ට හා රැකියා නියෝජිතයන්ට එරෙහි නඩු දිගටම කරගෙන යන්නේ කෙසේද වැනි පිළියම් කාරක යාන්ත්‍රණයන් පිළිබඳ වඩාත් විස්තරාත්මක තොරතුරු සපයන්න.
- නීතිය උල්ලංඝනය කරන බඳවා ගැනීමේ නියෝජිතයන්ට එරෙහිව පැමිණිල ඉදිරිපත් කිරීම සඳහා බඳවා ගැනීමේ ගාස්තු හා යාන්ත්‍රණයන් සම්බන්ධ නෛතික සීමා පිළිබඳව තොරතුරු සපයන්න.
- පිටත්ව යන ගෘහ සේවියන් සඳහා නම, ලිපිනය, ඔවුන්ගේ සේව්‍යයාගේ දුරකතන අංකය, තානාපති කාර්යාලයේ ලිපිනය හා දුරකතන අංකය, සේවය කරන රටේ ක්‍රියාත්මක වන ඔවුන්ගේ රැකියා නියෝජිත ආයතනයේ නම, ලිපිනය හා දුරතන අංකය, තානාපති කාර්යාලයේ පෙර ක්‍රම ලේඛිත (pre-programmed) අංක සහිත ජංගම දුරකතන හෝ දුරකතන කාඩ් පතක්, දේශීය මුදලින් නිශ්චිත ප්‍රමාණයක්, ඔවුන්ගේ ගමන් බලපත්‍රයෙන් පිටපතක්, අරාබි හා ගෘහ සේවියන්ගේ මූලික භාෂාව යන දෙකෙන්ම යුත් සේවා ගිවිසුමේ පිටපතක් අඩංගු තොරතුරු කට්ටලයක් ලැබීම සහතික කරන්න.

*අපේක්ෂිත සංක්‍රමණික ගෘහ සේවියන් සඳහා දැනුවත් බව නැගලීමේ ප්‍රසිද්ධ වැඩ සටහන් ව්‍යාප්ත කරන්න.*

- බඳවා ගැනීමේ ගාස්තු සම්බන්ධ නෛතික සීමා හා සෞදි අරාබියේ සේවා ගිවිසුම් කොන්දේසි පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමට, අපේක්ෂිත සංක්‍රමණික ගෘහ සේවියන්ගේ ගම් හා ප්‍රාදේශීය සේවා ස්ථාන ඉලක්ක කරන්න.
- ඔවුන් සංක්‍රමණය වීමට හා රැකියා ඒජන්සියක සේවය ලබාගැනීමට තීරණය කිරීමට පෙර අපේක්ෂිත සංක්‍රමණික ගෘහ සේවියන්ට මෙම තොරතුරු සපයා දීමේදී සංක්‍රමණිකයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ ක්‍රියාකරන කණ්ඩායම් සමග සහයෝගී වන්න.
- ස්ත්‍රීන්ට කරකියා ගත හැකි දෙයක් නැතිව නොව හොඳින් හිතා බලා සංක්‍රමණයට හැකි වීම සඳහා අධ්‍යාපනික හා සේවා අවස්ථා ව්‍යාපත් කළ යුතු ය.

## සියලු ආණ්ඩු වෙත.

අරාබි හා ගෘහ සේවියාට තේරෙන භාෂාවක් යන දෙකටම පරිවර්තනය කළ අන්‍යොන්‍ය වශයෙන් පිළිගත් හා බලාත්මක කළ හැකි සේවා ගිවිසුම් නිර්මාණය කිරීමට සහයෝගී වන්න.

සේවියන් තම රටට ආපසු පැමිණීමෙන් පසු කරන පැමිණිලි ද ඇතුළත්ව පැමිණිලි ඇති වූ සේවියන් සඳහා ඒවාට පිලියම් යෙදීම සහතික කිරීම පිණිස යාන්ත්‍රණයන් නිර්මාණය කිරීමට සහයෝගී වන්න.

වැඩ කරන ස්ථානයේ සිර කර සිටින හා බේරී යාමට නොහැකි ගෘහ සේවියන් නිදහස් කර ගැනීම සඳහා ක්‍රමයක් සංවර්ධනය කරන්න. දේශීය නීතිය ක්‍රියාවට නැගීම, විදේශ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල හා අවශ්‍ය පරිදි රාජ්‍ය නොවන සංවිධාන අතර සම්බන්ධීකරණයක් ඇති කරන්න. උදාරනයක් ලෙස, සංක්‍රමණික ගෘහ සේවියන්ට ජංගම දුරකතන, බහුභාෂා හොට්ලයින් (ටෙක්ස්ට් පණිවුඩ හොට්ලයින් ඇතුළුව), හා ක්‍රියාත්මක කිරීමට සහ ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය පටිපාටින් ද ලබාදිය යුතු ය.

ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී හා ක්‍රියාවට නැගීමේදී සංක්‍රමණික ගෘහ සේවියන්ගේ හා සිවිල් සමාජයේ දායකත්වය ක්‍රියාකාරී ලෙස ඉල්ලා සිටින්න.

## ජාත්‍යන්තර කම්කරු සංවිධානයට හා සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය වෙත

2010 ජාත්‍යන්තර කම්කරු සම්මේලනයේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානය ගෘහස්ථ වැඩ ප්‍රමිතිගත වැඩ ගණයේ කාරණයක් ලෙස විභාග කරන විට එයට ගෘහස්ථ වැඩ පිළිබඳ ප්‍රඥප්තියක් ඉදිරිපත් කළ යුතු ය. මෙම විධිවිධාන ජාතික නීති බවට, ගෘහ සේවියන් සඳහා ආදර්ශ සේවා ගිවිසුමක් බවට හා නියාමනය කිරීමේ හා බලාත්මක කිරීමේ මෙවලම් බවට අනුකලනය (integrating) මාර්ගෝපදේශ නිර්මාණය කළ යුතු ය.

ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් හා සෞදි අරාබි නීතිය යටතේ ඔවුන්ගේ අයිතීන් සම්බන්ධයෙන් සංක්‍රමණික කම්කරුවන්ට කම්කරු අයිතීන් පිළිබඳ අධ්‍යාපනයක් ලබා දෙන තාක්ෂණික වැඩ සටහන් ව්‍යාපත් කිරීමට දේශීය කණ්ඩායම් සමග වැඩ කළ යුතු ය.

කම්කරු රෙගුලාසි, බඳවා ගැනීමේ ප්‍රමිතීන් හා ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් සමග අනුකූල වන බලාත්මක කිරීම ශක්තිමත් කිරීම පිණිස තාක්ෂණික සහාය හා විශේෂිත සන්නිවේදන ක්‍රමයක් ලබාදීමට ආණ්ඩු සමග වැඩ කළ යුතු ය.

කලාපීය සහයෝගීතාව වැඩි කිරීමට හා කොළඹ ක්‍රියාවලිය, තාවකාලික කොන්ත්‍රාත් කම්කරුවන් පිළිබඳ ගල්ෆ් සංසදය හා සංක්‍රමණය හා සංවර්ධනය සඳහා වන ගෝලීය සංසදය හරහා කෙරෙන කටයුතුද ඇතුළත්ව කෙටි කාලීන ශ්‍රමික සංක්‍රමණය සඳහා වන කලාපීය අවම ප්‍රමිතීන් ඇති කර ගැනීමට ආණ්ඩු සමග වැඩ කළ යුතු ය.

ගෘහ සේවියන් මැදිහත් කරගන්නා කැපවීම් හා ක්‍රියාකාරිත්වයට පත් කිරීම් පවත්වා ගැනීම පිණිස වෘත්තීය සංගම් සමග වැඩ කළ යුතු ය.

## ලෝක බැංකුව හා පෞද්ගලික පදනම් වැනි ප්‍රදානත ආයතනයන් වෙත

සංක්‍රමණික ගෘහ සේවියන් සඳහා වන දේශීය රාජ්‍ය නොවන හා අනෙකුත් සිවිල් සමාජ උපදේශන උත්සාහයන් හා සේවාවන් සඳහා වඩා විශාල මූල්‍ය හා ආයතනික සහයක් ලබා දෙන්න. මෙයට තාවකාලික කොන්ත්‍රාත් කම්කරුවන් පිළිබඳ ගල්ෆ් සංසදය වැනි කලාපීය ක්‍රියාවලීන්ට සහභාගිවීමට ආධාර කිරීම හා ශ්‍රමිකයන් යවන රටවල හා ශ්‍රමිකයන් ලබා ගන්නා රටවල සිවිල් සමාජ කණ්ඩායම් අතර වර්ධනය කළ ජාලගත කිරීම ඇතුළත් වේ.

වාසස්ථාන පහසුකම් සඳහා හා විදේශ දූත කාර්ය මණ්ඩලවල ගෘහ සේවියන් සඳහා වැඩ කරන සමාජ සේවකයන් ඇතුළු පුහුණු කාර්ය මණ්ඩල සඳහා සම්පත් වැඩි කරන්න.

සංක්‍රමණය වීමට අවශ්‍ය ස්ත්‍රීන්ට සංක්‍රමණික වියදම් ආවරණය කර ගැනීම සඳහා වඩා වාසිදායක පොලී අනුපාත සපයන ක්ෂුද්‍ර ණය දෙන වැඩ සටහන්වලට අරමුදල් සපයන්න.

තමන්ගේ රටවල කල්පවත්නා ආදායම් ඉපයීමේ කටයුතු සංවර්ධනය කිරීම සඳහා වන ව්‍යාපෘති වැනි ස්ත්‍රීන් සඳහා වන දිගු කාලීන ගෘහ සේවා නියුක්ති මූලෝපායන්ට අරමුදල් සපයන්න.